# <u>නිෂ්පාදන කර්මාන්ත</u>

## නැව් තැනීමේ කර්මාන්තය

- දේෂ ගවේෂණ කටයුතු හා යකඩ හා වානේ කර්මාන්තයේ දියුණුවත් සමග වර්ධනය වූ කර්මාන්තයකි
- **යුරෝපා රටවල නැව් තැනීමේ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු**
    1. දේෂගවේෂණ කටයුතු,වෙළද,ධිවර,යුධමය කටයුතු සඳහා නැව්වලට ඇති ඉල්ලුම ඉහල යාම
    2. දැව හා වානේ පහසුවෙන් සපයා ගත හැකි වීම
    3. නැව් තටාක සඳහා සුදුසු කඩතොළු සහිත වෙරල ප්‍රදේශ පැවතීම
    4. රාජ්‍ය අනුග්‍රහය
- අතීතයේ මගී ප්‍රවාහනය මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය සඳහා නැව් නිපදවනු ලැබූ අතර වර්තමානයේ ප්‍රවාහනයට යොමු වන භාණ්ඩ වර්ග අනුව නැව් නිෂ්පාදනය කරයි
- **මුල් කාලයේ සංවර්ධිත රටවල් නැව් තැනීමේ කර්මාන්තයට යොමු වීමට බලපෑ හේතු**
    - ❖ විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කල හැකි වීම
    - ❖ අමුද්‍රව්‍ය ලෙස යකඩ හා වානේ පහසුවෙන් ලබාගත හැකි වීම
    - ❖ කිර්ති නාමය හා පලපුරුද්ද තිබීම
- **චීනය ,දකුණු කොරියාව,ජපානය වැනි ආසියතික රටවල් නැව් නිෂ්පාදනයේ ප්‍රමුඛයන් බවට පත් වීමට බලපෑ හේතු**
    - ❖ ලාභදායි ශ්‍රමය හා පුහුණුව සපයා ගත හැකි වීම
    - ❖ නව තාක්ෂණය
    - ❖ තටාක පහසුකම් සඳහා ජලය නොමිදෙන ගැඹුරු මුහුදු ප්‍රදේශ තිබීම

- **ලොව ප්‍රධාන නැව් නිෂ්පාදිත රටවල්**
    - ❖ ජපානය
    - ❖ නෙදර්ලන්තය
    - ❖ දකුණු කොරියාව
    - ❖ ජර්මනිය
    - ❖ චීනය
    - ❖ බ්‍රිතාන්‍ය
    - ❖ ඇ.එ.ජ





- **නැව් තැනීමේ කර්මාන්තයේ ලක්ෂණ හා ප්‍රවණතා**

    - ❖ ප්‍රවාහනය කරන භාණ්ඩ හා සේවාව අනුව සුවිශේෂ යාත්‍රා නිෂ්පාදනය කිරීම
    - ❖ අධි සුඛෝපභෝගී මගී නැව් නිෂ්පාදනය
    - ❖ විවිධ කාර්යයන් සඳහා නැව් නිෂ්පාදනය කිරීම
    - ❖ එකලස් කිරීමේ කර්මාන්තයක් ලෙස වර්ධනය වීම
    - ❖ යාන්ත්‍රික ශ්‍රමය බහුලව යොදා ගැනීම
    - ❖ විවිධ වූ බලශක්ති සම්පත් යොදා ගැනීම
    - ❖ විවිධ දියුණු තාක්ෂණික ක්‍රම නාවික ක්ෂේත්‍රයට එක් වීම(GPS)
    - ❖ වර්තමානයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වැඩි වශයෙන් නැව් යොදා ගැනීම
    - ❖ ඉන්ධන බහාලුම් සහ තොග භාණ්ඩ ප්‍රවාහන නෞකා සඳහා ඉහල ඉල්ලුමක් පැවතීම

**ක්‍රියාකාරකම**

1. **විවිධ අවශ්‍යතා අනුව නිෂ්පාදනය කරනු ලබන නැව් සඳහා උදාහරණ 5ක් නම් කරන්න**
2. **නවීන තාක්ෂණයේ දියුණුව ,නාවික කර්මාන්තයේ දියුණුවට බලපා ඇති ආකාරය කෙටියෙන් පහදන්න**
3. **ලොව ප්‍රධාන නැව් නිෂ්පාදිත රටවල් ලෝක ආකෘති සිතියමක ලකුණු කොට නම් කරන්න**
4. **අන්තර්ජාතික වෙළඳාමේදී නාවික පරිවහනයට ඉතා වැදගත් තැනක් හිමි වේ.පැහැදිලි කරන්න**

